**ශීර්ෂය 220 - ආයුර්වේද දෙපාර්තමේන්තුව - 2021**

---

1. මූල්‍ය ප්‍රකාශන

---

1.1 තත්ත්වාගණනය කළ මතය

---

ආයුර්වේද දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ආයුර්වේද දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 31 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමණාකරන විගණන වාර්තාව 2022 අගෝස්තු 03 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට ආයුර්වේද දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

---

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව, දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව
---------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව.

(ආ) මෙම වාර්තාවේ 1.6.3 ඡේදයේ සඳහන් නිරීක්ෂණ සම්බන්ධයෙන් ඉකුත් වර්ෂයේ කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-----------------------------------------

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2020 දෙසැම්බර් 31 දිනට නොනිම් වැඩ රු.836,749,569 ක් හා එදිනට අදාළ වැය විෂයන්ට හර කර තිබුණු උපකරන මිලදී ගැනීම් රු.14,900,000 ක්, ඉකුත් වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණු බැවින් එම වියදම් සමාලෝචිත වර්ෂයේ දේපල පිරියත හා උපකරණ ආරම්භක ශේෂයට එකතුකර දක්වා තිබුණු නමුත් අදාළ සංශෝධනය පිළිබඳ ගිණුම් සටහන්වලින් අනාවරණය කර නොතිබුණි. | සිගාස් පරිගණක වැඩසටහන මඟින් වත්කම් ගිණුම්ගත කිරීමේදී සටහන්වීමේ දෝෂයක් හටගෙන තිබුණු බව හා එය ජ'නල් සටහන් මඟින් නිවැරදි කිරීමට කටයුතු කර ඇති බව. | සිගාස් පරිගණක වැඩසටහන මඟින් වත්කම් ගිණුම්ගත කිරීමේදී සටහන්වීමේ දෝෂයක් ජ'නල් සටහන් මඟින් නිවැරදි කිරීමට කටයුතු කර ඇති බව දන්වා ඇති නමුත්, පොදු සම්මත ගණකාධිකරණ මූලධර්මවලට අනුව, ආරම්භක ශේෂ සංශෝධනයන් පිළිබඳව ගිණුම් සටහන්වලින් අනාවරණය කළ යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂය තුළදී මිලදී ගෙන තිබුණු කාර්යාලීය ලී බඩු හා උපකරණ රු.4,697,345 ක් අදාළ වැය විෂයයන්ට හර කර තිබුණු නමුත් මූල්‍ය නොවන වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | සිගාස් පරිගණක වැඩසටහන මඟින් වත්කම් ගිණුම්ගත කිරීමේදී සටහන්වීමේ දෝෂයක් හටගෙන තිබුණු බව හා මේ වන විට එය ජ'නල් සටහන් මඟින් භාණ්ඩාගාරය වෙත වාර්තා කර ඇති බව. | වැරදි නිවැරදි කිරීමටත්, භාණ්ඩාගාර මුද්‍රිත සටහන් දෙපාර්තමේන්තු පොත් පත් සමඟ නිරන්තරව සැසඳුම් කිරීමටත් කටයුතු කිරීම මගින් මෙවැනි අඩුපාඩු වලක්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් යටතේ යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම යන වැය විෂයය යටතේ සලසා ගෙන තිබුණු රු.67,500,000 ක පරිපූරක ප්‍රතිපාදනවලින් රු.11,809,305 ක් ලී බඩු උපකරණ මිලදී ගැනීමට වැයකර තිබුණි. | අයවැය යෝජනා යටතේ අතිරේක ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා ආයුර්වේද රෝහල් අවශ්‍යතා ලේඛනයක් ඉදිරිපත් කළ බව, මේ සඳහා අතිරේක ප්‍රතිපාදන ලබා දීමේදී මූලධන වත්කම් අත්පත් කර ගැනීම් - යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම යන වැය විෂය යටතේ සියළු අවශ්‍යතා සඳහා ප්‍රතිපාදන සලසා ඇති බව හා ඒ අනුව මූලික රෝහල් අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා අවශ්‍යතා මිලදි ගත් බව. | ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා ලී බඩු උපකරණ අවශ්‍යතා ලේඛනයක් භාණ්ඩාගාරයට ඉදිරිපත් කර නොතිබුණු බැවින්ද, වියදම් දරන අවස්ථාවේදී රෝහල් වෙතින් අවශ්‍යතා ලේඛන ගෙන්වා ගෙන තිබුණු නමුත් භාණ්ඩ බෙදා හැරීමේදී බොහෝ විට ඒ පිළිබඳව ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබුණු බැවින්ද, වියදමේ ස්වභාවය අනුව ප්‍රතිපාදන සලසා ගැනීමට හා වියදම් කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.6.2 විගණන සාක්ෂි නොවීම

| නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොඩනැගිලි දෙපාර්තමේන්තුව හා දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත පවරාදී තිබුණු ප්‍රතිපාදන යටතේ වැයකර තිබුණු රු.204,055,596 කට අදාළ කාර්යයන් ඉටුකිරීම පිළිබඳව දෙපාර්තමේන්තුව විසින් අධීක්ෂණය කර නොතිබීම, පසුවිපරම්කර නොතිබීම හා වියදම්වලට අදාළ විස්තර ලබා ගැනීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් එම ගනුදෙනු සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය. | වැයකර ඇති මුදලට අදාළ වියදම් භාණ්ඩාගාර සාරාංශ මඟින් නිසි ලෙස වත්කම් ලෙජර වෙත සටහන් කර ඇති බව. | වෙනත් දෙපාර්තමේන්තු මගින් ඉටුකරගනු ලබන මූලධන ව්‍යාපෘති කාර්යයන් නිසි ලෙස අධීක්ෂණය කිරීමටත්, ප්‍රගතිය සම්බන්ධයෙන් පසුවිපරම් සිදුකර ප්‍රමාණවත් වාර්තා පවත්වා ගැනීමටත් කටයුතු කළ යුතුය. |

1.6.3 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව, ඇප තැන්පත් ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. | ඉදිරියේදී ඇප තැන්පතු තැබිය යුතු නිලධාරීන්ගෙන් ඇප ලබාගෙන නිවැරදිව ඇප ලේඛනය යාවත්කාලීන කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව විධිමත් පරිදි ඇප ලේඛනය පවත්වා ගත යුතුය. |
| (ආ) | හානි හා පාඩු ලේඛනය පිළියෙල කර තිබුණු නමුත් එය මුදල් රෙගුලාසි 110 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව පිළියෙල කර නොතිබුණු අතර එය යාවත්කාලීන කරද නොතිබුණි. | මුදල් රෙගුලාසි 110 හි සඳහන් ආකෘතිය අනුව හානි හා පාඩු ලේඛනය පිළියෙල කර යාවත්කාලීනව පවත්වා ගෙන යාමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව විධිමත් පරිදි හානි හා පාඩු ලේඛනය පවත්වා ගත යුතුය. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූලධන වැය විෂයයන් 05 ක් සඳහා සලසා ගෙන තිබුණු රු.15,500,000 ක් වූ සමස්ත ඇස්තමේන්තු ප්‍රතිපාදනයම ඉතිරිව තිබුණු අතර මූලධන වැය විෂයයන් 07 ක් සඳහා සලසාගෙන තිබුණු රු.34,600,000 ක ප්‍රතිපාදනවලින් රු.26,734376 ක් හෙවත් සියයට 57 ත් සියයට 92 ත් අතර පරාසයක ප්‍රතිපාදන ඉතිරිව තිබුණි. | කොරෝනා වසංගත තත්ත්වය හා ආනයන සීමාවීමත්, ප්‍රසම්පාදන කටයුතු ක්‍රියාත්මක කිරීමට නොහැකිවීමත් හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරිව ඇති බව. | දෙපාර්තමේන්තුවේ කාර්යභාරය, පෙර වර්ෂවල වියදම් ප්‍රවනතාවයන්, වෙළඳපල හා වෙනත් පාරිසරික සාධක සැලකිල්ලට ගෙන මුදල් රෙගුලාසි 50 හි දැක්වෙන විධිවිධාන ප්‍රකාරව හැකිතාක් දුරට නිවැරදි හා තාත්වික වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය. |
| (ආ) | මූලධන වැය විෂයයන් 02 ක් සඳහා සලසා ගෙන තිබුණු රු.15,000,000 ක ප්‍රතිපාදනවලින් රු.6,738,981 ක ප්‍රතිපාදන වෙනත් වැය විෂයයන්ට මාරු කර තිබුණු අතර රු.7,288,520 ක ප්‍රතිපාදන ඉතිරිව තිබුණි. | -එම - | -එම - |

| | | | |
|---|---|---|---|
| (ඇ) | මූලධන වැය විෂයයන් 04 ක් සඳහා පරිපූරක ඇස්තමේන්තු මගින් රු.277,000,000 ක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණු නමුත් ඉන් රු.181,744,101 ක් ඉතිරිව තිබුණි. | -එම - | පරිපූරක ඇස්තමේන්තු යටතේ අත්‍යාවශ්‍ය හා නිශ්චිත මූලධන ව්‍යාපෘති වෙනුවෙන් ප්‍රතිපාදන වෙන්කරගෙන ඉන් තුනෙන් දෙකකට අධික ප්‍රතිපාදන භාවිතා නොකිරීම මූල්‍ය කළමනාකරණ දුර්වලතාවයක් වන බැවින් ඒ පිළිබඳව දැඩි අවධානයෙන් කටයුතු කළ යුතුය. |
| (ඈ) | වෛද්‍ය සැපයුම් යටතේ වැය විෂයන් 02 ක් සඳහා සලසා තිබුණු රු.130,000,000 ක ප්‍රතිපාදනවලින් රු.42,879,976 ක් එම වැය විෂයන්හි අරමුණුගත කාර්යයන් සඳහා වැය නොකර වෙනත් වැය විෂයන්ට මාරුකර තිබුණු අතර රු.15,226,152 ක ප්‍රතිපාදන ඉතිරිව තිබුණි. | නාවින්න හා බොරැල්ල ආයුර්වේද රෝහල්වල කොරෝනා අන්තර් ප්‍රතිකාර මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම නිසා සාමාන්‍ය රෝගීන් සඳහා ප්‍රතිකාර සිදු නොකිරීම හේතුවෙන් ඖෂධ අඩුවෙන් ඇණවුම් කිරීමට සිදුවූ බැවින් ඖෂධ සඳහා වෙන් වූ ප්‍රතිපාදන ඉතිරි වූ බව හා අතිරේක ප්‍රතිපාදන සලසාගත යුතු වැය විෂයයන් වෙත ඉතිරිවීම් අපේක්ෂා කළ හැකි වැය විෂයයන් වෙතින් ප්‍රතිපාදන මාරු කර ගත් බව. | දෙපාර්තමේන්තුවේ කාර්යභාරය, පෙර වර්ෂවල වියදම් ප්‍රවනතාවයන්, වෙළඳපල හා වෙනත් පාරිසරික සාධක සැලකිල්ලට ගෙන මුදල් රෙගුලාසි 50 හි දැක්වෙන විධිවිධාන ප්‍රකාරව හැකිතාක් දුරට නිවැරදි හා තාත්වික වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය. |
| (ඉ) | පුනරාවර්තන වැය විෂයයක් සඳහා පරිපූරක ඇස්තමේන්තු මගින් රු.245,000,000 ක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණු නමුත් ඉන් රු.103,712,290 ක් ඉතිරිව තිබුණි. | අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත කොරෝනා වසංගතය වැලැක්වීම සඳහා ජනතාව වෙත නොමිලේ ඖෂධ මංජුසා ලබාදීමට ඇස්තමේන්තු කළ නිෂ්පාදන පිරිවැය අනුව ප්‍රතිපාදන වෙන්කළ නමුත් වෙළඳපල මිල ගණන් කැඳවීමේදී එම පිරිවැයට වඩා අඩු පිරිවැයකට එම කාර්යය ඉටුකර ගත හැකිවීමෙන් මෙම ඉතිරිවීම් සිදුව ඇති බව. | -එම - |

2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

-----------------------------------

| විගණන නිරීක්ෂණය<br>--------------------- | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>----------------------------------- | නිර්දේශය<br>------------ |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක (iii) ලෙස ඉදිරිපත් කරන බැරකම් පිළිබඳ ප්‍රකාශයේ දක්වා තිබුණු රු.24,776,561 ක බැරකම්, මුදල් රෙගුලාසි 94(2) හා 94 (3) ප්‍රකාරව සටහන් අංක (iv) ලෙස ඉදිරිපත් කරන එළඹෙන ලද බැදීම් පිළිබඳ ප්‍රකාශයේද ඇතුළත් කර තිබුණි. | මෙම වරද ඉදිරි වර්ෂයේදී නිවැරදි කිරීමට අදාළ නිලධාරීන් දැනුවත් කළ බව. | මුදල් රෙගුලාසි 94(1) විධිවිධාන යටතේ හඳුනාගත යුතු බැරකම්, වාර්ෂිකව පුනරාවර්තනය වන සේවාවන් හෝ සැපයුම් වෙනුවෙන් එළඹෙන බැදීම් හා මුළු පිරිවැය ඇස්තමේන්තු මත බැදීම් වශයෙන් වෙන වෙනම හඳුනාගෙන අදාළ ආකෘතියට අනුව වාර්තා කළ යුතුය. |
| (ආ) | ඇණවුම්කර මිලදී ගැනීමේ ගිවිසුම්වලට එළඹ තිබුණු නමුත් 2021 දෙසැම්බර් 31 දින වන විටත් ලැබී නොතිබුණු රෝහල් ගෘහ භාණ්ඩවල පිරිවැය රු.4,203,756 ක් හා පරිගණක හා උපාංගවල පිරිවැය රු.28,110,150 ක්, මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක (iv) ලෙස ඉදිරිපත් කරන එළඹෙන ලද බැදීම් පිළිබඳ ප්‍රකාශයේ ඇතුළත්කර නොතිබුණි. | ඉදිරි ගිණුම් වර්ෂයන් සඳහා එළඹෙන ලද බැදීම්, මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක (iv) ලෙස ඉදිරිපත් කරන එළඹෙන ලද බැදීම් පිළිබඳ ප්‍රකාශයේ ඇතුළත් කිරීමට කටයුතු කරන බව. | ඉදිරි ගිණුම් වර්ෂයන් සඳහා එළඹෙන ලද බැදීම්, මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක (iv) ලෙස ඉදිරිපත් කරන එළඹෙන ලද බැදීම් පිළිබඳ ප්‍රකාශයේ ඇතුළත් කළ යුතු බව. |

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | නිරීක්ෂණය<br>අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) 1961 අංක 31 දරන ආයුර්වේද පනතේ 10 වන වගන්තිය | ආයුර්වේද ආරෝග්‍ය ශාලා, ආයුර්වේද ඖෂධ නිෂ්පාදනාගාර, ආයුර්වේද ඖෂධ ශාලා හෝ ආයුර්වේද බෙහෙත් ගබඩා ආයුර්වේද කොමසාරිස්වරයා විසින් ලියාපදිංචි කරනු ලැබිය යුතු වුවද, පංචකර්ම සහ සම්බාහන මධ්‍යස්ථාන ලියාපදිංචි කිරීම පිළිබඳ විධිවිධාන පනතට ඇතුළත් කර නොතිබුණු බැවින් පංචකර්ම වෛද්‍ය ක්‍රමය භාවිතය නියාමනය කළ නොහැකිවී තිබුණි. | ආයුර්වේද පනත ප්‍රකාරව ආයුර්වේද ආරෝග්‍ය ශාලාවක්, ආයුර්වේද ඖෂධ නිෂ්පාදනාගාරයක්, ආයුර්වේද ඖෂධ ශාලාවක් හෝ ආයුර්වේද බෙහෙත් ගබඩාවක් පමණක් නියාමනය කළ හැකි බව හා සම්භාහන මධ්‍යස්ථාන එම ගණයට අයත් නොවන බව, අමාත්‍යාංශ ලේකම්ගේ නියෝගය මත සංචාරක මණ්ඩලයේ අනුමැතියලත් හෝටල් සහ සංචාරක ආකර්ශන ආයතන සඳහා පමණක් ලියාපදිංචිය ලබාදීම අනුමත කර ඇති බව. | පංචකර්ම සහ සම්බාහන මධ්‍යස්ථාන නියාමනය සඳහා විධිමත් නෛතික රාමුවක් ඇති කිරීම සඳහා කටයුතු කළ යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මුදල් රෙගුලාසි 103 | මුළු අලාභය රු.165,850 ක් වූ වාහන අනතුරු 04 කට අදාළව රු.101,600 ක් රක්ෂණ වන්දිවලින් ආවරණය කර ගෙන තිබුණු නමුත් එම අනතුරු පිළිබඳව මුදල් රෙගුලාසි 103(1) හි (ඇ), (ඈ), (ඉ), (ඊ), (උ) හා (ඌ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි 104(4) ප්‍රකාරව පරීක්ෂණය සිදු කිරීම සඳහා 2021 වර්ෂයේ අනතුරුවලට අදාළ ලිපිගොනු කමිටුව වෙත ලබා දුන් බව හා මේ වන තෙක් එම වාර්තා ලැබී නොමැති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) මුදල් | තත්කාර්ය අතුරු අග්‍රිම අදාළ | ITMIS මාර්ගගත වැඩසටහන | නිලධාරීන් වෙත |

| | | | | |
|---|---|---|---|---|
| | රෙගුලාසි 371(ආ) | කාර්යයට ආසන්න දිනයකදී ලබාගෙන එම කාර්යය නිමකළ වහාම පියවිය යුතු වුවද, කාර්යය ආරම්භ කෙරෙන දිනට දින 02 ත් දින 10 ත් අතර කාලයකට පෙර අවස්ථා 11 කදී නිලධාරීන් 03 දෙනෙකු වෙත රු.218,960 ක තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණු අතර අවස්ථා 19 කදී නිලධාරිනියක විසින් ලබාගෙන තිබුණු රු.407,200 ක තත්කාර්ය අතුරු අග්‍රිම හා ඉතිරි මුදල් පියවීමට දින 11 ත් දින 123 ත් අතර කාලයක් ගතකර තිබුණි. | මහින් ඇතුළත් කරන වවුචර් සඳහා භාණ්ඩාගාරයෙන් මුදල් ලබා ගැනීමට අත්තිකාරම් ඉල්ලීම් වවුචර් සති දෙකකට පමණ පෙර පරිගණක පද්ධතියට ඇතුළත් කළ යුතු බැවින් අත්තිකාරම් ලේඛනයේ අදාළ දිනයන්ට පෙර ඇතුළත් කිරීමට සිදුවන බව. | මුදල් ලබා දුන් දිනයන් පදනම් කර ගෙන නිරීක්ෂණය පිළියෙල කර ඇති අතර ඉදිරිපත්කර තිබුණු අදහස් දැක්වීම පිළිගත නොහැකි වේ. මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (iii) | මුදල් රෙගුලාසි 770(4) | ධාවනයෙන් ඉවත්කර වසර ගණනාවක් ගතව තිබුණු කැබ්රථ 02 ක්, බස් රථයක් හා යතුරු පැදි 05 ක් අළුත්වැඩියාකර භාවිතයට ගැනීමට හෝ අපහරණය කිරීමට හෝ කටයුතුකර නොතිබුණි. | ආයුර්වේද දෙපාර්තමේන්තුව සතු ධාවන තත්ත්වයේ නොමැති, අපහරණය කළ යුතුව තිබුණු කැබ් රථ 02 ක්, බස් රථ 01 ක් හා යතුරුපැදි 04 ක් සෞඛ්‍ය අමාත්‍යාංශයේ වාහන සමඟ අපහරණය කිරීම සඳහා 2022 පෙබරවාරි 14 දින සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත භාරදී ඇති බව හා එක් යතුරු පැදියක් දේශීය වෛද්‍ය අමාත්‍යාංශයට අයත් වන බැවින් ඒ පිළිබඳව අමාත්‍යාංශය දැනුවත් කර ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (iv) | මුදල් රෙගුලාසි 756(6) | සමාලෝචිත වර්ෂය සඳහා වන භාණ්ඩ සමීක්ෂණ කටයුතු 2022 මාර්තු 15 දිනට පෙර අවසන් කළ යුතු වුවද, 2022 මැයි 15 දින වන විටත් එම කටයුතු අවසන් කර නොතිබුණි. | කොරෝනා වසංගත තත්ත්වය හා ඉන්ධන හිඟකම හේතුවෙන් අනුරාධපුර ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාල, මැදවච්චිය වකුගඩු රෝහල, මිහින්තලය ආයුර්වේද රෝහල හා කන්නෙලිය ඖෂධ උයන යන ස්ථානවල භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදු නොකළ බව බොරැල්ල ජාතික රෝහලේ භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන්වීමට නියමිතව ඇති බව හා අනෙකුත් ආයතනවල 2021 වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදුකර ඇති බව. | -එම- |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය | රජයේ වාහනවල සෑම ඉන්ධන පරීක්ෂාවකටම පසු මාස 12 ක කාල සීමාවකින් පසුව හෝ කිලෝමීටර් 25,000 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිම සම්බන්ධ ප්‍රධාන අළුත්වැඩියාවකට පසුව හෝ යන කාරණා අතරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන දහනය පරීක්ෂා කළ යුතු වුවද දෙපාර්තමේන්තුවේ වාහන සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි. | ආයුර්වේද දෙපාර්තමේන්තුව සතු වාහනවල ඉන්ධන දහන පරීක්ෂාව සිදු කිරීම සඳහා කමිටුවක් පත්කර ඇති බව හා රටේ පවතින ඉන්ධන අර්බුදය හා ඉන්ධන මිල ඉහළ යාම හේතුවෙන් මෙම පරීක්ෂාව තාවකාලිකව නවතා ඇති බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2019 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2(iv) ඡේදය | වේලාව පදනම් කර ගනිමින් අතිකාල හා නිවාඩු දින වැටුප් ගෙවීමේදී අදාළ කාලය ඇඟිලි සලකුණු යන්ත්‍ර මඟින් සනාථ කර ගත යුතු වුවද, ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතයකින් තොරව පැමිණීමේ ලේඛන පමණක් පදනම් කර ගනිමින් සමාලෝචිත වර්ෂය තුළදී අතිකාල හා නිවාඩු දින වැටුප් ලෙස රු.55,335,614 ක් ගෙවා තිබුණි. | 2020 වර්ෂයේ ආයුර්වේද දෙපාර්තමේන්තුව යටතේ පවතින සියළු ආයතන හා රෝහල්වල ඇඟිලි සළකුණු යන්ත්‍ර සවි කළ නමුත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ඇඟිළි සළකුණු යන්ත්‍ර භාවිතා නොකරන බැවින් ආයුර්වේද දෙපාර්තමේන්තුව තුළද එලෙස කිරීම අවශ්‍ය නොවන බව අමාත්‍යාංශ ලේකම් දන්වා තිබුණු බැවින් 2021 වර්ෂයේ අතිකාල හා නිවාඩු දින වැටුප් ගෙවීම සඳහා ඇඟිළි සළකුණු යන්ත්‍ර සටහන් පාදක කර නොගත් බව. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

2.4 අත්තිකාරම් ගිණුම් ශේෂ

---------------------------

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | ---------------------------------- | ----------- |
| (අ) | ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 1.6, 1.7 හා 6.3 වගන්ති හා 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 1.1.7 ඡේදය ප්‍රකාරව, ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ තෙමසක් තුළ නිරවුල් කළ යුතු වුවද, ස්ථාන මාරුවී ගිය නිලධාරීන් 10 දෙනෙකුගේ 2021 දෙසැම්බර් 31 දිනට වර්ෂ 05 ක කාල සීමාවක් ඉක්මවා තිබුණු නොපියවූ ණය ශේෂවල එකතුව රු.316,249 ක් විය. | මෙම නිලධාරීන් අතරින් බොහෝ දෙනෙකු ඔවුන් ස්ථාන මාරු වූ බවට සඳහන් වන ආයතනවල සේවයේ නිරත නොවන බව එම ආයතන විසින් දන්වා ඇති බව හා ඔවුන් සත්‍ය වශයෙන් ස්ථාන මාරුවී ඇති ආයතන පිළිබඳ තොරතුරු අනාවරණය කරගත් විගස ආයතන සංග්‍රහයේ දැක්වෙන විධිවිධාන ප්‍රකාරව ඉදිරි කටයුතු සිදු කිරීමට පියවර ගන්නා බව. | ආයතන සංග්‍රහයේ හා ජාතික අයවැය චක්‍රලේඛයේ දැක්වෙන විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු අතර එසේ කටයුතු කිරීමේ වගකීම ඉටුනොකළ නිලධාරීන්ගෙන් මෙම මුදල අයකර ගැනීමට මුදල් රෙගුලාසි 104 (2) "ආ" ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදයේ 21.3 වගන්තිය ප්‍රකාරව, වැඩ තහනමට ලක්වූ නිලධාරීන් සම්බන්ධයෙන් පැවැත්වෙන විනය පරීක්ෂණ කටයුතු හැකිතාක් අප්‍රමාදව අවසන් කිරීම අත්‍යාවශ්‍ය වුවද, වැඩ තහනමට ලක්වී වර්ෂ 01 ත් වර්ෂ 03 ත් අතර කාලයක් ගතවී තිබුණු නිලධාරීන් 04 දෙනෙකුගෙන් රු.198,885 ක්ද, වර්ෂ 05 ක කාලයක් ඉක්මවා තිබුණු නිලධාරීන් 06 දෙනෙකුගෙන් රු.198,260 ක්ද අයකර ගැනීමට අපොහොසත්වී තිබුණි. | 2022 මැයි මාසය වනවිට නිලධාරීන් 02 දෙනෙකුගෙන් රු.37,970 ක් අයකර ගෙන ඇති බව. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 4.2.4 වගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව නිලධාරියෙකු විශ්‍රාම ගැනීමට නියමිතව ඇති කල්හි ඔහුගෙන් අයවිය යුතු සියළුම ණය පිළිබඳ විස්තර විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතු අතර, 4.2.5 වගන්තිය ප්‍රකාරව නිලධාරියාගේ පරිවර්තිත විශ්‍රාම වැටුපෙන් හෝ පාරිතෝෂිත මුදල්වලින් හෝ අයකර ගත යුතුය. 2021 දෙසැම්බර් 31 දිනට විශ්‍රාමගොස් මාස 3 ඉක්ම වූ නිලධාරීන් 18 දෙනෙකුගෙන් අයවිය යුතු මුළු ණය ශේෂය රු.1,429,037 ක් වූ අතර එම ණය අයකර ගැනීම සඳහා ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණු බව හෝ ඊට හේතුවූ වෙනත් කරුණු තිබේද යන බව හෝ විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි. එම ණය ශේෂ අතරින් විශ්‍රාම ගිය නිලධාරීන් 03 දෙනෙකුගෙන් අයවිය යුතු වසර 04 කට වඩා පැරණි රු.62,050 ක්ද විය. | 2022 මැයි මාසය වනවිට නිලධාරීන් 06 දෙනෙකුගෙන් රු.575,815 ක් අයකර ගෙන ඇති බව. | -එම- |
| (ඈ) | 2019 ජුනි 27 දිනැති අංක 05/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3(ඉ)(ii) ඡේදය ප්‍රකාරව, සේවය හැර ගිය නමුත් නැවත සේවයේ පිහිටුවා නොතිබුණු නිලධාරීන්ගේ ජාතික හැඳුනුම්පත් අංකය මැතිවරණ කොමසාරිස් වෙත ඉදිරිපත් කර පදිංචිය පිළිබඳව විස්තර විමසා ප්‍රාදේශීය | සේවය අතහැර ගිය නිලධාරීන්ගේ ණය ශේෂයන් සම්බන්ධයෙන් මේ වන විට කටයුතු කරමින් පවතින බව, පෞද්ගලික ලිපි ගොනුවල පවතින අඩුපාඩු, පෙර ණයගැති විශ්ලේෂණවල ඉදිරිපත් කර ඇති තොරතුරු නිවැරදි නොවීම හා | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| ලේකම් මගින් එම නිලධාරීන්ගේ වත්කම් පිළිබඳව තහවුරු කර ගැනීමෙන් අනතුරුව නීතිපති මගින් ණය මුදල අයකර ගත යුතු වුවද, 2021 දෙසැම්බර් 31 දින වන විට සේවය හැරගිය මාස 03 ඉක්ම වූ නිලධාරීන් 23 දෙනෙකුගෙන් අයවිය යුතු මුළු ණය ශේෂය රු.1,207,060 ක් එපරිදි අයකර ගෙන නොතිබුණු අතර ඉන් සියයට 68 ක් හෙවත් රු.825,560 ක් වර්ෂ 05 කට වඩා වැඩි කාලයක් පැරණි ණය ශේෂ විය. | නියමිත කාලවලදී ණය ශේෂයන් නිරවුල් නොවීම යන කරුණු හේතුවෙන් තවදුරටත් ප්‍රමාදවීම් සිදුව ඇති බව හා ඉදිරියේදී ප්‍රගතිය වාර්තා කිරීමට කටයුතු කරන බව. | |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සැලැසුම් කිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බොරැල්ල ආයුර්වේද ශික්ෂණ රෝහලේ ඖෂධ නිෂ්පාදන අංශය මගින් තෛල වර්ග 23 කින් බෝතල් 13,500 ක් හා ගුගුල් වර්ග 08 කින් කිලෝ ග්‍රෑම් 790 ක් සමාලෝචිත වර්ෂය තුළදී නිෂ්පාදනය කිරීමට සැලසුම් කර තිබුණු නමුත් කාර්ය මණ්ඩල ඌනතාවය හා ඖෂධ අමුද්‍රව්‍ය ප්‍රමාණවත් පරිදි සපයා ගෙන නොතිබීම හේතුවෙන් තෛල වර්ග 09 කින් බෝතල් 2,977 ක් හා ගුගුල් වර්ග 07 කින් කිලෝ ග්‍රෑම් 268 ක් පමණක් නිෂ්පාදනය කර තිබුණි. | ඉදිරි නිෂ්පාදන කටයුතු සැලසුම් කිරීමේදී දෙපාර්තමේන්තුව සතු භෞතික හා මානව සම්පත්හි ධාරිතාවයන් සැළකිල්ලට ගනිමින් ඇස්තමේන්තු සැකසීමට අදාළ අංශ ප්‍රධානීන් දැනුවත් කළ බව. | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම පරිදි කටයුතු කර සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ගැනීමට හැකි වන පරිදි සැලසුම් පිළියෙල කළ යුතුය. |

### 3.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) දෙපාර්තමේන්තුව විසින් මූල්‍ය ප්‍රකාශන සමඟ 2021 වාර්ෂික කාර්යසාධන වාර්තාවේ කෙටුම්පතක් ඉදිරිපත්කර තිබුණු නමුත් එය 2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය යටතේ රාජ්‍ය | 2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය යටතේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව ඉදිරියේදී වාර්ෂික | 2022 වර්ෂයේ සිට ඉදිරියට වාර්ෂික ගිණුම් සමඟ නිවැරදි ආකෘතිය ප්‍රකාරව පිළියෙල කළ වාර්ෂික |

| | | | |
|---|---|---|---|
| | මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව නිවැරදිව පිළියෙල කර නොතිබුණි. | කාර්යසාධන වාර්තාව නිවැරදිව පිළියෙල කිරීමට නිලධාරීන්ට උපදෙස් ලබා දුන් බව. | වාර්තාවේ කෙටුම්පතක් ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | 2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව, ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් මුදල් වර්ෂය අවසානවී දින 150 ක් ඇතුළත සමාලෝචිත වර්ෂයට අදාළ කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, 2020 වර්ෂයේ කාර්යසාධන වාර්තාව 2022 මැයි 30 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව, කාර්යසාධන වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතුය. |

3.3 ප්‍රසම්පාදනයන්
-----------------

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළදී මුළු පිරිවැය රු.20,799,715 ක් වූ අයිතම 23 කට අයත් කාර්යාලීය ගෘහ භාණ්ඩ ඒකක 1,239 ක් හා මුළු පිරිවැය රු.6,987,850 ක් වූ රෝහල් ගෘහ භාණ්ඩ ඒකක 312 ක් මාතලේ ප්‍රදේශයේ සැපයුම්කරුවකුගෙන් මිලදීගෙන තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයේ ප්‍රසම්පාදනය සැලසුම් කර තිබීම, කාර්යාලීය ලී බඩු උපකරණ සම්බන්ධයෙන් පත්කළ තාක්ෂණික ඇගයීම් කමිටුවට විෂයය විශේෂඥයකු පත්කර නොතිබීම, පිරිවිතර සැකසීම හා එම පිරිවිතරවලට අනුකූලව උපකරණ ලබාගැනීම සම්බන්ධව ප්‍රමාණවත් සැලකිල්ලක් දක්වා නොමැතිවීම, සියළුම උපකරණ පිරිවිතරවලට අනුකූලව ලැබී ඇති බවට විධිමත්ව තහවුරු කර ගැනීමකින් තොරව ගෙවීම් කර තිබීම, ඇණවුම්කළ ප්‍රමාණයට වඩා වැඩියෙන් සපයා තිබුණු උපකරණ සඳහා ගෙවීම් කිරීම, ඇණවුම්කළ උපකරණවලට වඩා වෙනස් උපකරණ භාරගැනීම සහ ගෙවීම් කිරීම, ප්‍රමාද ගාස්තු අයකර නොතිබීම සහ ප්‍රතිපාදන සලසා නොගත් වැය විෂයයක් යටතේ රු.11,809,305 ක් ගෙවීම් කිරීම යන අඩුපාඩු මෙම ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළ පැවැති බව නිරීක්ෂණය විය. | එක් එක් අංශ වලින් ලැබී ඇති ලිඛිත ඉල්ලීම් පාදක කරගෙන අවශ්‍යතා ලේඛන පිළියෙල කළ බව, රෝහල් ගෘහ භාණ්ඩ මිලදී ගැනීමේදී විෂය විශේෂඥයෙකු තාක්ෂණික ඇගයීම් කමිටුවට පත්කර ඇති බව, සියළුම උපකරණ පිරිවිතරවලට අනුකූල බවට භෞතිකව පරීක්ෂා කර ගෙවීම් සිදුකර ඇති බව, එවකට රටේ පැවති කොරෝනා වසංගත තත්ත්වය හා අමුද්‍රව්‍ය හිඟතාවය සලකා භාණ්ඩ සැපයීම ප්‍රමාදවීම වෙනුවෙන් ප්‍රමාද ගාස්තු අයකර නොමැති බව හා මින් ඉදිරියට මෙවැනි අඩුපාඩු සිදු නොකරන ලෙස අදාළ නිලධාරීන් දැනුවත් කළ බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ නිවැරදිව අනුගමනය කළ බව හා විනිවිදභාවයෙන් කටයුතු කළ බව තහවුරු කිරීම සඳහා ලිඛිත සාක්ෂි පවත්වා ගනිමින් ප්‍රසම්පාදනයන් මෙහෙයවිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | දේශීය ඖෂධ මගින් කොවිඩ් 19 වසංගතය පාලනය කිරීමට එකක් රු.1,000 ක් පිරිවැය වූ සුවධරණී ඖෂධ මංජුසා ලක්ෂ 60 ක් බෙදා දීමේ ව්‍යාපෘතියක් සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන තිබුණි. ආරම්භයේදී බස්නාහිර පළාතට ඖෂධ මංජුසා 250,000 ක් සැපයීමට පරිපූරක ප්‍රතිපාදන රු.250,000,000 ක් වෙන්කර ගෙන ඉන් රු.142,562,809 ක් වැය කර තිබුණි. ඖෂධ මංජුසා සැකසීමේ සියළුම කාර්යයන් එක් සැපයුම්කරුවෙකු වෙත ලබා දීමට හැකිවන පරිදි මිලගණන් කැඳවීමෙන් ගතවන කාලය, නිෂ්පාදනවල තත්ත්වය අපතය හා පිරිවැය අවම කරගැනීම යනාදී කරුණු කෙරෙහි අවධානය යොමු නොකොට ඖෂධ හා කැඳ නිෂ්පාදනයට සැපයුම්කරුවන් 07 දෙනෙක්ද, ඇසුරුම් මුද්‍රණයට එක් සැපයුම්කරුවෙක්ද, කාඩ්බෝඩ් පෙට්ටි හා අත්පත්‍රිකා මුද්‍රණයට එක් සැපයුම්කරුවෙක්ද, ඖෂධ හා කැඳ ඇසුරුම් කිරීමට සැපයුම්කරුවන් 07 දෙනෙක්ද වශයෙන් සැපයුම්කරුවන් තෝරාගෙන තිබුණි. තවද, ලංසු ඇගයීමේදි පැවති විවිධ අඩුපාඩු පසුව සම්පූර්ණ කිරීමට යටත්ව සැපයුම්කරුවන් තෝරා ගැනීම, තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශ නොසලකා කටයුතු කිරීම, සියලුම ප්‍රසම්පාදනයන් නියමිත දිනට අවසන් නොකිරීම, ප්‍රසම්පාදන මණ්ඩලයේ අනුමැතිය රහිතව කාලය දීර්ඝ කිරීම, ප්‍රමාද ගාස්තු අය නොකිරීම, මිල කමිටුවේ මිල ගණන් ඉක්මවා ගෙවීම් කිරීම යන අඩුපාඩු මෙම ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළ පැවැති බව නිරීක්ෂණය විය. ඖෂධ මංජුසා සෞඛ්‍ය ආරක්ෂිතව ගබඩා නොකිරීම, අක්‍රමවත් බෙදාහැරීම, ඖෂධ පිරවීමටත් පෙර ඇසුරුම්වල කල් ඉකුත් වීමේ දිනය මුද්‍රණය කර තිබීම හේතුවෙන් ඇතැම් ඖෂධ කල් ඉකුත් වූ සේ සලකා ඉවත් කිරීම, කල් ඉකුත්වීමට පෙර ඖෂධ භාවිතා කිරීමට ප්‍රමාණවත් කාලයක් ප්‍රතිලාභීන්ට ලැබී නොතිබීම, ඉලක්ක ගත ප්‍රතිලාභීන් වෙත ඖෂධ ලැබීම සහ භාවිතය පිළිබඳ අධීක්ෂණය සහ පසුවිපරම් නොකිරීම, බස්නාහිර පළාතට බෙදා හැරීමට සැලසුම් කළ මංජුසා 250,000 කින් 183,776 ක්ම ගම්පහ දිස්ත්‍රික්කයේ පමණක් බෙදා හැර තිබීම, දින 60 ක් තුළ දිවයින පුරා මංජුසා ලක්ෂ 60 ක් බෙදාහැරීම සඳහා හදිසි ප්‍රසම්පාදන ක්‍රම අනුගමණය කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන තිබුණද 2021 දෙසැම්බර් 31 දිනට දින 122 ක් ගතව තිබුණද ව්‍යාපෘතියෙන් සියයට 05 ක්වත් අවසන්කර නොතිබීම, යනාදී අඩුපාඩු මෙම ප්‍රසම්පාදනය තුළ පැවති බව වැඩිදුරටත් නිරීක්ෂණය විය. | ලංසු ඇගයීමේදී පැවැති අඩුපාඩු ගෙවීම් කිරීමට පෙර නිවැරදි කර ගැනීමට කටයුතු කර ඇති බව, ගබඩා කිරීම බෙදාහැරිම සහ මුද්‍රිත කල් ඉකුත්විමේ දිනය වැනි ගැටළුකාරී තත්වයන් මතු වූ අවස්ථාවලදී ඒ සම්බන්ධයෙන් පියවර ගත් බව, අධීක්ෂණය හා පසුවිපරම් කටයුතු සිදු කළ බව, කොවිඩ් රෝග තත්වය මත ගම්පහ දිස්ත්‍රික්කයට ප්‍රමුඛතාව දුන් අතර අනෙකුත් දිස්ත්‍රික්කද බොහෝ දුරට අවරණය කළ බව හා ව්‍යාපාතියේ අරමුණු සියයට සියයක් ඉටුකර ගැනීමට නොහැකි වූ බව. | රජයේ මුදල් අරපිරිමැසුම්දායක ලෙස භාවිතා කරමින් අත්‍යවශ්‍ය හා ප්‍රමුඛ අරමුණු ඉටුකර ගැනීම සඳහා පමණක් ව්‍යාපෘති යෝජනා ක්‍රියාත්මක කළ යුතු අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ නිවැරදිව අනුගමනය කරමින් හා විනිවිදභාවය තහවුරු කරමින් ප්‍රසම්පාදන කටයුතු මෙහෙයවිය යුතුය. |

3.4 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාල පරිශ්‍රය, බොරැල්ල ශික්ෂණ රෝහල ඇතුළුව රෝහල්, ඔසු උයන්, ප්‍රජා සෞඛ්‍ය ප්‍රාදේශීය කාර්යාල හා සංචාරක බංගලා ඉඩම් 17 ක් දෙපාර්තමේන්තුව වෙත පවරාගෙන නොතිබුණි. එසේ වුවද, සමාලෝචිත වර්ෂය තුළදී මෙම ඉඩම්වල නව ඉදිකිරීම් සඳහා රු.21,059,428 ක්ද නඩත්තු කටයුතු සඳහා රු.29,274,335 ක්ද වැයකර තිබුණි. | දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාල පරිශ්‍රය, රෝහල්, ඔසු උයන්, ප්‍රජා සෞඛ්‍ය ප්‍රාදේශීය කාර්යාල, සංචාරක බංගලා දෙපාර්තමේන්තුව වෙත පවරාගෙන නොතිබුණද අත්‍යවශ්‍ය නඩත්තු හා සංවර්ධන කටයුතු සිදු කිරීමට මුදල් වියදම් කර ඇති බව හා මෙම ඉඩම්වල අයිතිය දෙපාර්තමේන්තුවට පවරා ගැනීමට අවශ්‍ය මූලික කටයුතු ආරම්භ කර ඇති බව. | අදාළ ඉඩම් පවරා ගැනීමේ කටයුතු කඩිනම් කළ යුතුය. |
| (ආ) | කල්බදු වාරික ගෙවීම් ක්‍රමය යටතේ 2012 වර්ෂයේදී ටොයෝටා ලංකා ආයතනයෙන් මිලදීගෙන තිබුණු මුළු පිරිවැය රු.8,400,000 ක්වූ වෑන් රථයක් කල්බදු කාලසීමාවෙන් අනතුරුව දෙපාර්තමේන්තුව වෙත පවරාගෙන නොතිබුණි. | මෙම වාහනයේ අයිතිය ආයුර්වේද දෙපාර්තමේන්තුව වෙතට පවරා දෙන ලෙස ඉල්ලීමක් 2018 ඔක්තෝබර් 09 දින මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් වෙත යවා ඇති බව, කොවිඩ් වසංගත තත්ත්වය හා වාහන රැසක පැවරීම් කටයුතු එකතුවීම හේතු කොටගෙන මෙම පැවරීම ප්‍රමාදවී ඇති බව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් දැනුම්දී ඇති බව හා ඉදිරි දිනකදී අවශ්‍ය කටයුතු සිදු කිරීමට නියමිත බව. | වෑන් රථයේ අයිතිය දෙපාර්තමේන්තුව වෙත පවරාගැනීමට අප්‍රමාදව අවශ්‍ය කටයුතු සිදුකළ යුතුය. |
| (ඇ) | 2017 ජුනි 28 දිනැති අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ටෝලර් ජනරාල් කාර්යාලය වෙත වාර්තා කර නොතිබුණි. | විගණන නිරීක්ෂණය පිළිගන්නා බව. | නියමිත කාල සීමාවන් තුළ අදාළ වාර්තා සැපයීමට කටයුතු කළ යුතුය. |

## 3.5 පාඩු හා හානි

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මංචංතොඩුවායි ආයුර්වේද රෝහලේ සේවය කර වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවට ස්ථාන මාරුවී තිබුණු ආයුර්වේද වෛද්‍යවරයෙකුට 2012 ජූලි මාසයේ සිට 2013 සැප්තැම්බර් මාසය දක්වා මාස 15 ක් තුළදී එම ප්‍රාදේශීය සභාවෙන් වැටුප් ගෙවා තිබියදී ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින්ද වැටුප් ලෙස රු.548,376 ක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වා වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව කටයුතු නොකර අවස්ථා 04 කදී රු.260,000 ක් පමණක් වාරික වශයෙන් අය කරගෙන තිබුණි. ඉතිරි රු.288,376 ක් ගෙවීම පැහැර හැර වසර 10 කට ආසන්න කාලයක් ගතවී තිබුණු නමුත් අදාළ වෛද්‍යවරයාට එරෙහිව නීත්‍යානුකූලව කටයුතු කිරීමට හෝ මුදල් රෙගුලාසි 104 (2) “ආ” ප්‍රකාරව වගකිවයුතු නිලධාරීන්ගෙන් අධිභාර කිරීමට හෝ කටයුතු කර නොතිබුණි. | මෙම ආයුර්වේද වෛද්‍ය නිලධාරී විසින් වංචනික ලෙස වැටුප් ලබා ගැනීම සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව විසින් විනයානුකූල පරීක්ෂණයක් පවත්වා ලබාදී තිබුණු නියෝගය අනුව වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හරහා විනයානුකූලව කටයුතු කිරීමට වයඹ පළාත් පාලන කොමසාරිස් වෙත දැනුම්දී ඇති බව. | වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් දෙපාර්තමේන්තුව නොවිමසා ගෙවා ඇති වැටුප් සම්බන්ධයෙන් පමණක් විනයානුකූලව කටයුතු කර තිබුණු බැවින් හා දෙපාර්තමේන්තුව ගෙවූ වැටුප්වලින් රු.288,376 ක් තවදුරටත් අයවිය යුතු බැවින්, මේ සම්බන්ධයෙන් නීත්‍යානුකූලව කටයුතු කිරීමට හෝ මුදල් රෙගුලාසි 104 (2) “ආ” ප්‍රකාරව වගකිවයුතු නිලධාරීන්ගෙන් අධිභාර කිරීමට හෝ කටයුතු කළ යුතු අතර, පිරිස් පාලන අංශය හා වැටුප් පාලන අංශය අතර යාවත්කාලීන හා අඛණ්ඩ සම්බන්ධතාවයන් තහවුරු කෙරෙන පාලන ක්‍රම හඳුන්වා දීමට කටයුතු කළ යුතුය. |

## 3.6 කළමනාකරණ දුර්වලතා

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| දෙපාර්තමේන්තුව සතුව බස් රථ 02 ක්, ලොරි රථ 02 ක්, කැබ් රථ 09 ක්, වෑන් රථ 07 ක්, මෝටර් කාර් 05 ක්, ජීප්රථ 02 ක්, ගිලන්රථ 09 ක්, ත්‍රීවිලර් 06 ක් හා ට්‍රැක්ටර් යතුරුපැදි ඇතුළු වාහන 55 ක් පැවැති අතර සමාලෝචිත වර්ෂය තුළදී මෙම වාහනවලට ඉන්ධන සැපයීම හා අළුත්වැඩියාවන් සඳහා රු.13,172,415 ක් වැයකර තිබුණි. නමුත් මෙම වාහනවලට අදාළ ලොග් පොත් හා ධාවන සටහන් විධිමත් පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබීම, ඉන්ධන පාරිභෝජනය පිළිබඳ පරීක්ෂාවන් සිදුකර නොතිබීම, සේවා කිරීම් හා අළුත්වැඩියාවන් ප්‍රමාදයකින් තොරව සිදු නොකිරීම, වාහන සඳහා ඉන්ධන පිරවීමේදී එම කටයුතු මාණ්ඩලික නිලධාරියෙකුගේ අධීක්ෂණය යටතේ සිදුකර නොතිබීම, වාහන අනතුරු සම්බන්ධයෙන් පොලිසියට පැමිණිලි නොකිරීම, විධිමත් පරිදි ප්‍රමාදයකින් තොරව පරීක්ෂණ පවත්වා අදාළ වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකිරීම් සිදුනොකර රක්ෂණ වන්දි මගින් අලාභ ආවරණය කරගැනීමට පමණක් යොමුව තිබීම සහ රියදුරන්ගේ අක්‍රමිකතාවයන් වලක්වා ගැනීම සඳහා ප්‍රමාණවත් පාලන ක්‍රම අනුගමනය නොකිරීම යනාදී කරුණු හේතුවෙන් දෙපාර්තමේන්තුවේ වාහන පරිපාලනය හා ආරක්ෂාව සම්බන්ධයෙන් සතුටුදායක තත්ත්වයක් නොපැවැති බව නිරීක්ෂණය විය. | වාහන අළුත්වැඩියාවන් හා සේවා සිදු කිරීම, ටයර් හා බැටරි දැමීම ආදී කටයුතු ලොග් පොත්වල සටහන් කරන බව, පවතින ප්‍රතිපාදන කළමනාකරණය කර ගනිමින් වාහනවල අත්‍යාවශ්‍ය අළුත්වැඩියාවන් හා සේවාවන් සිදු කරන බව, වාහන සඳහා ඉන්ධන පිරවීමේදී ඉන්ධන ඇණවුම ධාවන සටහන් සමඟ පරීක්ෂා කර මාණ්ඩලික නිලධාරියකුගේ අධීක්ෂණය යටතේ අත්සන් කරන බව, පූර්ණ රක්ෂණාවරණයක් පවතින විට ඒ යටතේ අළුත්වැඩියා කරගන්නා අතර එසේ නොමැති නම් පැමිණිල්ල සටහන් කර අදාළ නීතිමය ක්‍රියාමාර්ග ගෙන නඩු පැවරීමක් සිදුකළ යුතු බැවින් සුළු හා අනෙකුත් පාර්ශවයකට හානි සිදු වී නොමැති වාහන අනතුරුවලදී පොලිස් වාර්තා ලබාගෙන නොමැති බව හා වාහන අනතුරු පරීක්ෂණ පැවැත්වීම සඳහා පත් කරනු ලබන කමිටු මගින් දෙනු ලබන මු.රෙ. 104(4) පරීක්ෂණ වාර්තාවන් ප්‍රකාරව අදාළ වගකිවයුතු නිලධාරියාගෙන් හෝ රක්ෂණ වන්දි මගින් හෝ අලාභ ආවරණය කරගැනීමට කටයුතු කරන බව. | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් පරිදි, පාලන පටිපාටි යථා පරිදි සිදුවන බවට නිරීක්ෂණය නොවන බැවින් ඡේදයේ සඳහන් කරුණු සම්බන්ධයෙන් වැඩි අවධානයක් යොමුකර අවශ්‍ය පියවර ගත යුතුය. |

3.7 නොවිසඳුණු විගණන ඡේද
------------------------------

| විගණන නිරීක්ෂණය<br>----------------------- | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>------------------------------------------- | නිර්දේශය<br>----------- |
| --- | --- | --- |
| අවශ්‍යතාවය නිවැරදිව හඳුනා නොගෙන හා ශක්‍යතා අධ්‍යයනයකින් තොරව 2015 මාර්තු 16 දින රු.මිලියන 28ක් වැයකර බණ්ඩාරනායක ආයුර්වේද පර්යේෂණායතනයට යන්ත්‍ර හා උපකරණ 14 ක් මිලදී ගෙන තිබුණු අතර ඉන් රු.මිලියන 21 ක් වටිනා යන්ත්‍ර 8 ක් 2021 ඔක්තෝබර් 15 වන විටත් සවිකර නොතිබුණි. මුළු පිරිවැය රු.14,591,311 ක් වූ යන්ත්‍ර 06 ක් නිෂ්පාදනාගාරය සඳහා අවශ්‍ය නොවන බවට 2020 ඔක්තෝබර් 05 දින පත්කර තිබුණු කමිටුවක් විසින් හඳුනාගෙන තිබුණි. නිසි කොන්ත්‍රාත් ගිවිසුමකට සහ සේවා හා අළුත්වැඩියා සඳහා ගිවිසුම්වලට එළඹීමකින් තොරව මෙම කොන්ත්‍රාත්තුව ක්‍රියාත්මක කර තිබුණු බැවින් සවිකර තිබුණු යන්ත්‍ර උපකරණද සමාලෝචිත වර්ෂය වන විට භාවිතයට ගත නොහැකි තත්වයේ පැවතුණි. මේ අනුව මෙම ව්‍යාපෘතිය සඳහා වැය කර තිබුණු රු.28,342,712 ක මුළු මුදල අනාර්ථික වියදමක් විය. | නාවින්න පර්යේෂණායතනයේ පවතින යන්ත්‍ර හා උපකරණ පිළිබඳව විශේෂඥ කමිටුවක් මඟින් පරීක්ෂණයක් සිදුකර මේ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කරන ලෙස අමාත්‍යාංශ ලේකම් විසින් දන්වා ඇති බව හා ඒ අනුව ඉදිරි කටයුතු කරන බව. | සියළුම යන්ත්‍ර ඵලදායි ලෙස උපයෝජනය කිරීමට හෝ ආයුර්වේද රෝහල්වල හෝ ආයුර්වේද සංස්ථාවේ ඖෂධ නිෂ්පාදනයට යොදා ගැනීම සඳහා ලබාදීමට කටයුතු කළ යුතු අතර අවශ්‍යතාවය නිවැරදිව හඳුනා නොගෙන හා නිසි ශක්‍යතා අධ්‍යයනයකින් තොරව මෙම මිලදී ගැනීම සඳහා දායක වූ සියළුම නිලධාරීන් සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගත යුතුය. |

4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම
---------------------------------------------

| විගණන නිරීක්ෂණය<br>----------------------- | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>------------------------------------------- | නිර්දේශය<br>----------- |
| --- | --- | --- |
| 2017 අංක 19 දරන තිරසාර සංවර්ධන පනතේ 3.6, 3.9,11 හා 11.2 වගන්ති ප්‍රකාරව, ආයතනයේ අරමුණු ළඟාකර ගැනීම උදෙසා සිය සම්පත් කාර්යක්ෂමව මෙහෙයවිය යුතු අතර තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම පිණිස ආයතනය විසින් සපුරාගත යුතු ඉලක්කයන් හා එම ඉලක්කයන් සපුරා ගැනීම සඳහා පවතින පරතරයන්ද, ප්‍රගතිය මැන බැලීම සඳහා සුදුසු දර්ශකයන්ද හඳුනාගත යුතුය. නමුත් දෙපාර්තමේන්තුව විසින් එවැනි දර්ශකයන් | අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීමට අදාළව ඉලක්ක, දර්ශක හඳුනා ගැනීමට හා ප්‍රගතිය මිණුම් කිරීමට කටයුතු කළ යුතුය. |

හඳුනාගෙන අරමුණුවලින් ලඟාකරගත් ප්‍රමාණය හා බැහැරවීම් මෙන්ම අවධානය යොමු කළ යුතු විවිධ ක්ෂේත්‍රයන් හඳුනාගෙන නොතිබුණි.

5. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුව සඳහා කළමනාකරණ දත්ත පද්ධතියක් සකස් කර ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණු නමුත්, 2022 අගොස්තු මාසය අවසන් වන විටද අදාළ දත්ත පද්ධතිය ස්ථාපිත කර නොතිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව හා එහි අනුබද්ධ ආයතන, රෝහල්, වෛද්‍ය මධ්‍යස්ථාන ඇතුළු සම්පූර්ණ ආයතන පද්ධතියට අදාළ යාවත්කාලීන කළමනාකරණ තොරතුරු කාර්යක්ෂමව ලබා ගැනීමට අපහසුව පැවැති අතර දෙපාර්තමේන්තුවේ කාර්යමණ්ඩල පැමිණීම හා පිටවීම සටහන් කිරීමේ පාලනය, කාර්යසාධන පාලනය, වැටුප් පාලනය, අතිකාල වියදම් පාලනය, පුද්ගලික ලිපිගොනු පාලනය යනාදී පාලනයන් දුර්වල මට්ටමක පැවැති බව නිරීක්ෂණය විය. | රටෙහි පැවති කෝරෝනා වංසගත තත්ත්වය හේතුවෙන් මේ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කිරීම ප්‍රමාද වූ බව හා ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා සුදුසු වැඩ පිළිවෙලක් කඩිනමින් සකස් කරන බව. | දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාල පරිශ්‍රය, රෝහල්, ඔසු උයන්, ප්‍රජා සෞඛ්‍ය ප්‍රාදේශීය කාර්යාල, යනාදී සියළුම අංශවල කටයුතු සම්බන්ධීකරණය කළ හැකි කළමනාකරණ දත්ත පද්ධතියක් ස්ථාපිත කළ යුතුය. |
| (ආ) | 2021දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ අනුමත කාර්යය මණ්ඩලය 2,647 ක් වුවද, එදිනට තථ්‍ය කාර්යය මණ්ඩලය 1,939 වූයෙන් අනුමත කාර්යය මණ්ඩලයෙන් සියයට 27 කට සමාන පුරප්පාඩු සංඛ්‍යාව 708 ක් විය. මෙම පුරප්පාඩු තුළ ජ්‍යෙෂ්ඨ මට්මේ අනුමත කාර්යය මණ්ඩලය 830 කින් 663 ක් හෙවත් සියයට 80 ක් පුරප්පාඩුව පැවතීම දෙපාර්තමේන්තුවේ මෙන්ම ඒ යටතේ වූ රෝහල්වල කාර්යසාධනයට දැඩි බලපෑමක් සිදුවී තිබුණි. තවද කාර්යය මණ්ඩලයෙන් සියයට 10 කට සමාන සේවකයින් 260 දෙනෙකු අනියම්, තාවකාලික හා කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවා තිබුණි. | ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරි තනතුරු හා හෙද නිලධාරි තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කිරීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ඉල්ලා ඇති බව හා නව බඳවා ගැනීම් සිදු කිරීමට මෙතෙක් අනුමැතිය ලබා දී නොමැති බව. | ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු සහ රෝහල්වල අත්‍යවශ්‍ය තනතුරුවලට ප්‍රමුඛතාව දෙමින් පවතින මානව සම්පත්වලින් උපරිම ඵලදායිතාවයක් ලබා ගැනීම සඳහා කාර්යමණ්ඩල ප්‍රතිසංවිධානයක් සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ අධිශ්‍රේණියේ වෛද්‍ය නිලධාරීන් විසින් දැරිය යුතු තනතුරු 18 ක් දෙපාර්තමේන්තුවේ පැවතියද ඉන් තනතුරු 02 කට පමණක් ස්ථිර නිලධාරීන් පත් කර තිබුණු අතර තනතුරු 09 කට රාජකාරි ආවරණ හා තාවකාලික පදනම මත පත්කිරීම් සිදු කර තිබුණි. ඉතිරි තනතුරු 06 ක් 2022 මැයි 30 දින වන විටත් පුරප්පාඩුව පැවතුණි. | අධි ශ්‍රේණියට උසස්වීම් ලද ආයුර්වේද වෛද්‍ය නිලධාරීන් සේවා ස්ථාන වෙත යොමු කිරීමට අවශ්‍ය තොරතුරු රාජ්‍ය අමාත්‍යාංශය හා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති නමුත් එම තනතුරු සඳහා පත් කිරීම් මෙතෙක් සිදු කර නොමැති බැවින් රාජකාරී ආවරණ කටයුතු සඳහා සුදුසු නිලධාරීන් අදාළ තනතුරුවලට අනුයුක්ත කර ඇති බව. | අධි ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරීන් සිටියදී එම නිලධාරීන් විසින් දැරිය යුතු තනතුරුවලට පහළ ශ්‍රේණිවල නිලධාරීන් රාජකාරි ආවරණ හා තාවකාලික පදනම මත පත්කිරීම් නොකළ යුතුය. |